# ආරක්ෂක අමාත්‍යාංශය
# ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය (NBRI)

## ඇබෑර්තු

ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ, නාය යෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ අංශය යටතේ ඇති දිස්ත්‍රික් කාර්යාලවල ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ තනතුර සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම තනතුරෙහි කාර්යභාරයට, සමස්ත නායයෑම් අවදානම් කළමනාකරණ උපාය මාර්ග ක්‍රියාත්මක කිරීම, තාක්ෂණික නායකත්වය ලබා දීම සහ කාර්යය මණ්ඩලය පුහුණු කිරීම, නියමිත තාක්ෂණික පරීක්ෂණ කමිටු සඳහා දායක වීම, නායයෑම් විමර්ශන සිදු කිරීම, අවදානම් කළමනාකරණ පියවරයන් ක්‍රියාත්මක කිරීම සහ සවිස්තරාත්මක තාක්ෂණික වාර්තා සකස් කිරීම ඇතුළත් වේ.

### (1.0) ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ AR - 2 (මහනුවර, කළුතර, නුවරඑළිය, බදුල්ල, මාතලේ, කෑගල්ල, රත්නපුර, ගාල්ල, මාතර, කුරුණෑගල යන සෑම දිස්ත්‍රික් කාර්යාලයක් සඳහාම එක් නිලධාරියකු බැගින්) (තනතුරු 10)

**බාහිර අයදුම්කරුවන් :**

**සුදුසුකම් (පහත අ හෝ ආ)**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය සංයෝජනයක් සහිතව අදාළ ක්ෂේත්‍රයේ ඉංජිනේරු විද්‍යාව / විද්‍යාව / තාක්ෂණය පිළිබඳ අවුරුදු හතරක (04) ප්‍රථම උපාධිය

සහ

පශ්චාත් උපාධි සුදුසුකම (Master's) හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය

සහ

රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක, ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු අවම වසර අටක (08) පර්යේෂණ සහ සංවර්ධන පළපුරුද්ද.

හෝ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය සංයෝජනයක් සහිතව ඉංජිනේරු විද්‍යාව / විද්‍යාව / තාක්ෂණය පිළිබඳ හෝ තනතුරට අදාළ ක්ෂේත්‍රයක විශේෂවේදී උපාධිය

සහ

අදාළ ක්ෂේත්‍රයේ Ph.D (දර්ශන සූරි) උපාධිය

සහ

රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසු අවම වසර පහක (05) පර්යේෂණ පළපුරුද්ද

**අභ්‍යන්තර අයදුම්කරුවන් :**

**සුදුසුකම් : (පහත අ හෝ ආ)**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින්, අදාළ විෂය සංයෝජනයක් සහිතව අදාළ ක්ෂේත්‍රයේ ඉංජිනේරු විද්‍යාව / විද්‍යාව / තාක්ෂණය පිළිබඳ විශේෂ / සාමාන්‍ය උපාධිය

සහ

පශ්චාත් උපාධි සුදුසුකම (Master's) හෝ අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් වෘත්තීය ආයතනයක ආයතනික සාමාජිකත්වය

සහ

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අධ්‍යයන / පර්යේෂණ - (AR-1) කාණ්ඩයේ තනතුරක අවම වසර අටක (08) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණකර තිබීම

හෝ

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් අදාළ විෂය සංයෝජනයක් සහිතව අදාළ ක්ෂේත්‍රයේ ඉංජිනේරු විද්‍යාව / විද්‍යාව / තාක්ෂණය පිළිබඳ විශේෂ / සාමාන්‍ය උපාධිය

සහ

අදාළ ක්ෂේත්‍රයේ Ph.D (දර්ශන සූරි) උපාධිය

සහ

තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අධ්‍යයන / පර්යේෂණ - (AR - 1) කාණ්ඩයේ තනතුරක අවම වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

සටහන : අදාළ විෂය ක්ෂේත්‍රයෙහි පර්යේෂණ ප්‍රකාශන පළ කොට තිබීම අතිරේක සුදුසුකමක් ලෙස සලකනු ලැබේ. තෝරාගනු ලබන අයදුම්කරුවන් ආයතනික අවශ්‍යතාවය පරිදි අදාළ දිස්ත්‍රික් කාර්යාල වෙත අනිවාර්යයෙන්ම මාරු කරනු ලැබේ.

**පොදු කොන්දේසි :**

- **වැටුප් පරිමාණය** : AR - 2 (රු. 133,220 - 10 X 3,600 - 169,220/-)
  **මූලික වැටුප් පියවර** : රු. 116,763/- (කළමනාකරණ සේවා චක්‍ර ලේඛ අංක 01/2025 හි උපලේඛන II ට අනුව)
- **වයස් සීමාව** : වයස අවුරුදු 30 ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 55 ට වැඩි නොවිය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**වෙනත් ප්‍රතිලාභ :**

- ජීවන වියදම් දීමනාව
- ආයතනය විසින් සේවක අර්ථ සාධක අරමුදලට 12% ක් සහ සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට 3% ක් ද වශයෙන් දායක වනු ඇත.
- රජයේ චක්‍රලේඛ අනුව ප්‍රසාද දීමාන ගෙවනු ලැබේ.
- කාර්ය සාධනය පදනම් කරගත් මාසික දිරි දීමනා ගෙවීම
- වෛද්‍ය සහ ජීවිත රක්ෂණය
- දුරකථන දීමනාව
- රජයේ අනුමත වෙනත් ප්‍රතිලාභ

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත ආයතන හි සේවයේ නියුතු අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය. සම්පූර්ණ ජීව දත්ත තොරතුරු සහිත අයදුම්පත් අදාළ සහතිකවල තමන් විසින් සහතික කරන ලද පිටපත් ද සමග 2026 අප්‍රේල් 22 වන දින හෝ ඊට පෙර පහත් ලිපිනය වෙත ලැබෙන පරිදි ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. අයදුම් කරනු ලබන තනතුර කවරයෙහි ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය,**
**99/1, ජාවත්ත පාර, කොළඹ 05.**